''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; I කලාපය; 2023 මාර්තු; පිටු: 76-85

# සමාජ වෙනස්වීම මත ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ කාන්තාවගේ වෙනස්වීම

රශ්මිකා දෙව්මිණි ලියනගේ[1] සහ වී. පී. එස්. එස්. බාලසූරිය[2]
[1,2]සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
[1]rashmikadewmini97@gmail.com; [2]sewwandibalasooriyasjp@gmail.com

**සංක්ෂේපය**

සමාජය වූ වනාහි ගතික වූවක් වන අතර ක්‍රමානුකූලව හා කාලීන වශයෙන් වෙනස්වීම්වලට ලක්වන්නකි. සමාජය වෙනස්වීමත් සමඟ ඊට අනුබද්ධව සංස්කෘතියද වෙනස්වීමකට ලක්වේ.සමාජය මා සංස්කෘතිය විසින් ස්ත්‍රී පුරුෂ වශයෙන් සිදුකොට ඇති මෙම වෙනස්වීම මත එකිනෙකට වෙනස්වූ ගති ලක්ෂණ, අනන්‍යතාවයන්, හැසිරීම් රටාවන්, භූමිකාවන්, තත්ත්වයන් හා කාර්යයභාර්යයන් මත ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන්න කාලානුරූපීව අතීත කාන්තාවන්ට වඩා වර්තමාන කාන්තාවන්ගේ තත්වයෙහි හා කාර්යභාරයෙහි ඇති වූ අධ්‍යාපන තත්ත්වයේ, ආර්ථික තත්ත්වයේ, දේශපාලන තත්ත්වයේ වෙනස්වීම මත කාන්තානගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට බලපා ඇති ආකාරය පෙන්වා දී ඇති අතර සංස්ථාවන් කේන්ද්‍රීය කරගනිමින් අධ්‍යනය කිරීමේ දී කාන්තාව ජාත්‍යන්තර වශයෙන් කාන්තාවගේ සමාජ වෙනස්වීම,දේශීය වශයෙන් කාන්තාවගේ සමාජ වෙනස්වීම වශයෙන් වෙන් වෙන්ව අධ්‍යනය කළ හැකි අතර ඒ තුලින් කාන්තාව සමාජ සංස්ථාවන් මූලික කරගනිමින් සිදුව ඇති තත්වයෙහි හා කාර්යය භාරයෙහි සමාජ වෙනස්වීම අවබෝධ කරගත හැකිය.

**මුඛ්‍ය පද:** කාන්තාවගේ වෙනස්වීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සමාජ වෙනස්වීම, සමාජ සංස්ථා,

## හැඳින්වීම

සමාජය ගත්කළ විවිධාකාර සමාජ ආකෘතීන්ගෙන් සැදුම්ලත් පුළුල් වූ විෂය පථයකි. මෙකී සමාජය ගත් කළ එය සමාජ සංවිධානයක හෝ ව්‍යුහයක පැවති තත්වය සහ වර්තමාන තත්වය අතර වෙනස්වීමකට ලක්වේ. එම වෙනස සරල සමාජ සංකීර්ණ සමාජ වෙත ගමන් කිරීම හෝ සාම්ප්‍රදායික සමාජ නවීන සමාජ බවට පත්වීම හෝ අධ්‍යනය කරනු ලැබීමක් ලෙසද දැක්විය හැකිය. M.E Jones නම් සමාජ විද්‍යාඥයා සමාජ ක්‍රියාකාරීත්වයේ සමාජ අන්තර් සම්බන්ධතාවල හා සමාජ සංවිධාන තුළ සිදුවන නවීනත්වයක් ලෙස සමාජ වෙනස්වීම නිර්වචනය කර ඇති අතර මැක් අයිවර් එය මානුෂීය සබඳතාවල වෙනස්වීමක් යනුවෙන් දක්වයි. සමාජය වෙනස් වන විට ඊට අනුබද්ධව සංස්කෘතිය ද වෙනස් වේ (Monal,2019). ඒ අනුව සෑම සමාජ වෙනස්වීමක් නිසාම සංස්කෘතික වෙනසක් සිදුවන බව කිව යුතුය. මානව ජීවියා ජීව විද්‍යාත්මකව ස්ත්‍රී හා පුරුෂ වශයෙන් බෙදුමකට ලක්ව උපත ලබයි. මෙම ලිංගික වෙනස හේතුකොටගෙන ස්ත්‍රීන් හා පුරුෂයින් කායික හා මානසික මෙන්ම අභ්‍යන්තර හා බාහිර වශයෙන්ද යම් යම් වෙනස් ලක්ෂණවලින් යුක්ත වේ. සමාජය හා සංස්කෘතිය විසින් ස්ත්‍රී හා පුරුෂ වශයෙන් සිදු කොට ඇති මෙම බෙදීම සමාජයේ සෑම ඒකකයකදී මෙන්ම ස්ථරයකදීම දක්නට ලැබෙන අතර ස්ත්‍රීන්ට හා පුරුෂයින්ට එකිනෙකට වෙනස් වූ ගති ලක්ෂණ, අනන්‍යතාවයන්, හැසිරීම් රටාවන්, භූමිකා සහ වෘත්තීන් පවා සමාජය විසින් නිර්මාණය කර දී ඇත. මේ අයුරින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන පදය සමාජීය මෙන්ම මනෝභාව වශයෙන් වෙනස් වූ අර්ථයක් ගෙන දීමට සමත් වේ (Lindesey,1990).

මෙලෙස ස්ත්‍රී පුරුෂභාවය ගත්කළ කාලානුරූපිව සමාජයේ ඇතිවන්නට වූ කාර්මීකරණය නාගරීකරණය නවීකරණය බටහිරකරණය ගෝලීයකරණය ආදී වූ සමාජ වෙනස්වීමේ ක්‍රියාවලීන් නිසාවෙන් අතීත කාන්තාවට වඩා වර්තමාන කාන්තාවගේ තත්වයෙහි හා කාර්යභාර්යෙහි, ආර්ථික, සමාජීය, දේශපාලන, අධ්‍යාපන ආදී වශයෙන් වෙනස්වීමට ලක්ව ඇති අතර මෙම වෙනස්විම පෙන්වා දී ඇති ආකාරය පිළිබඳ මෙහිදී විග්‍රහ කෙරේ.

**සමාජ වෙනස්වීමත් සමග කාන්තාවගේ තත්ත්වයෙහි හා කාර්යභාර්යෙහි ඇති වූ වෙනස**

සමාජ වෙනස් වීමක දී සිදුවන ගතිකත්වයන් අතරින් තත්වය හා කාර්යභාර්ය වෙනස් වීම විශේෂ වේ. යම්කිසි සමාජයක් තුළ පුද්ගලයෙකු සතු යුතුකම් හා අයිතිවාසිකම් අනුව එම සමාජයේ ඔවුනට හිමිවන ස්ථානය තත්වය නමින්ද මෙම යුතුකම් හා අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීම කාර්යභාර්ය නමින්ද සරලව හැඳින්විය සමාජ වෙනස් වීම හේතුකොටගෙන පුරුෂයාට වඩා කාන්තාවගේ තත්වය හා කාර්යභාර්ය වෙනස් වී ඇති අතර අතීත සාම්ප්‍රදායික ජන සමාජයේ කාන්තාවගේ සමාජ තත්වය හා කාර්යභාර්යයන් අද වන විට බොහෝ සෙයින් වෙනසකට බඳුන්ව ඇති බව කිව යුතුම කරුණකි. කෙසේ වුවද සමාජ තත්ත්වය පිළිගැනීම පිළිබඳ සැලකීමේදී නූතන කාන්තාවගේ තත්වය පිළිබඳ සෑහිමකට පත්විය නොහැකිය. ඒ අනුව සමාජ වෙනස්වීමත් සමග කාන්තාවට සමාජය තුළ හිමි තත්වය පිළිබඳව සලකා බැලීම වැදගත් වේ.

අතීත මානවයා එනම් ස්ත්‍රිය හා පුරුෂයා යන දෙපාර්ශවයම සමාජය තුළ ජීවත් වීමේ දී යම් යම් තත්වයන් හා කාර්යභාර්යන් දරමින් එකම වහලක් යට එකට ජීවත් වෙමින් තම ජීවිකාව ගෙන ගියහ. ලොව සෑම සමාජයකම ස්ත්‍රිය හා පුරුෂයා වෙනස් ආකාරයෙන් දැකීම පමණක් නොව ඔවුනට හිමිකර දී ඇති තත්වයෙහි හා කාර්යභාර්යෙහි වෙනස සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික හා තාක්ෂණික ආදී සෑම ක්ෂේත්‍රයක් තුළම දැකගත හැකිය. මෙසේ කාන්තාව හා පුරුෂයා එකට වාසය කිරීම තුළ පුරුෂයාට සාපේක්ෂව කාන්තාවට යම් ආකාරයකට අයිතිවාසිකම් නිදහස, සමානාත්මතාවය යන සංකල්පයන් භුක්ති විඳීමේදීත්, වෘත්තීන් ලබාගැනීමේදීත්, පෞද්ගලික ජීවිතයේදීත් මෙන්ම පොදු ජීවිතය තුළද කාන්තාවන්ට වඩා පුරුෂයාව වැඩි වරප්‍රසාද ලබා ගන්නට විය.

මෙම වෙනස සඳහා ප්‍රධානතම හේතුව වූයේ ජීව විද්‍යාත්මක වශයෙන් කාන්තාව හා පුරුෂයා නිර්මාණය වී ඇති ආකාරයයි. අපි දන්නා ආකාරයට පුරුෂයෙකු ශාරීරිකව ඉතාමත් ශක්තිවන්ත එඩිතර, බුද්ධිමත් හා තාර්කික ඉහළ පෞරුෂත්වයක් සහිත පුද්ගලයෙකි. නමුත් ඔහුට සාපේක්ෂව කාන්තාව ඉතාමත් ළාමක, ශරීරයෙන් වඩාත් ශක්තිමත් නොවන සුන්දර හා පුරුෂවෙකු මත යැපෙන ඉක්මනින් සසල වන්නා වූ කෙනෙකි. මෙලෙස කාන්තාව ගත් කළ දරුවන් වැදීම දරුවන් පෝෂණය කරමින් රැක බලා ගනිමින් ගෘහාශ්‍රීත කටයුතු සිදුකිරීම කෘෂිකර්මාන්තයට උපකාර කිරිම ආදී දේ පුරාණ කාන්තාව වෙත පැවරී ඇත.

කාන්තාවට ප්‍රජනන කාර්යය පැවරී ඇත්තේ ස්වභාවයෙන්මය. එම නිසා ඇය අතීතයේ සිටම දරුවන් වැදීම පමණක් නොව දරුවන් පෝෂණය කරමින් ඔවුන් රැකබලා ගැනීම හා ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු නිසියාකාරව සිදු කර දීමද ඇයට පැවරුණු කාර්යයන් අතර විණි. දරුවන් සමග ගෘහය තුළ සිටිමින් ගෘහාශ්‍රිතව සියලු කටයුතු එනම් ගේදොර පිරිසිදු කිරීම්, ඉවුම් පිහුම්, රෝගීන් හා පවුලේබ වයස්ගත වූ පුද්ගලයන් රැකබලා ගැනීම ආදී සියලුම ගෘහාශ්‍රිත කටයුතු සිදුකිරීම කාන්තාව විසින් කළ යුතුය යන්න සමාජය විසින් පිළිගෙන ඇත. එම නිසා කාන්තාව ගෘහයට පමණක් සීමා වෙමින් කටයුතු කිරීම සාම්ප්‍රදායික සමාජය දෙස විමසිලිමත්ව බැලීමේදී මනාව පැහැදිලි වේ. නමුත් පුරුෂයා ආදි කාලීන ආර්ථික කටයුතුවලදී ගෘහයෙන් පිටත ගොස් ආරක්ෂාකාරී නොවන කටයුතුවල නිරත වීම දැකගත හැකිය. දඩයම් කිරීම, වෙළදාම, ගොවිතැන් කිරීම හෝ වෙනත් රැකියාවන්, සමාජ වැඩ කටයුතු මෙන්ම ස්ත්‍රීන්ට හා දරුවන්ට ආරක්ෂාව සලසා දීම වැනි කාර්යයන් පුරුෂයාට හිමි කාර්යයන් විය. ඒ අනුව ඔහු ගෘහයට නොව පොදු වැඩකටයුතුවලට අයත් ලෙස සලකන ලද අතර මෙවැනි කටයුතු නිසා පුරුෂයන් ශාරීරික ශක්තියෙන් හා සිතින් ශක්තිවන්ත, එඩිතර, නිර්භීත පුද්ගලයෙකු ලෙස සමාජය තුළ පිළිගැනුණි. සාම්ප්‍රදායික සමාජය තුළ කාන්තාවට වඩා පුරුෂයාට සමාජය තුළ වැඩි වරප්‍රසාද එසේත් නැතිනම් ඉහළ ස්ථානයක් හිමි වීම හා කාන්තාවන් හා පුරුෂයන් අතර තත්වයෙහි මෙන්ම කාර්යභාර්යෙහි ද වෙනසක් සිදුවිය.

ජී.පී මර්ඩොක් නම් ඇමරිකානු මානව විද්‍යාඥයා විසින් කාන්තාවට අයත් කාර්යභාර්යන් හඳුන්වාදීමේදී දඩයම, ආකර කර්මාන්තය, දැව කැපීම, ඉඩම් පවිත්‍ර කිරීම, නිවාස ඉදිකිරීම පිරිමියා සතු වැඩ බවත් ආහාර පිසීම, ආහාර පිණිස පලා එකතු කිරීම, ජලය ගෙන ඒම, ඇඳුම් ගෙත්තම් කිරීම, දරුවන් වැදීම හා රැක බලා ගැනීම ආදිය කාන්තාවට අයත් බවත් සඳහන් කරයි (මනුරත්න,2004,p.32).

එපමණක් නොව සාම්ප්‍රදායික සමාජය තුළ කාන්තාව තම ස්වාමියාට හා දරුවන්ට යුතුකම් හා වගකීම් ඉටු කිරීමට පමණක් නොව ආර්ථික ක්‍රියාවලිය තුළ පුරුෂයන් සමග එක්වීමෙන් කාන්තාව එම කටයුතු සඳහාද ඉතා ඉහළ මට්ටමක දායකත්වයක් ලබාදී ඇති බව කිව යුතුය. ඒ සඳහා කුඹුරු කෙටීම, කුඹුරෙහි ධාන්‍ය වැපිරීම, අවශ්‍ය පොහොර යෙදීම හා

කුඹුරු කැපීම ආදිය පුරුෂ පාර්ශවය විසින් සිදු කළ අතර වී ඉසීමෙන් අනතුරුව වල් පැළ නෙළීම හා පැළ සිටුවීම, ඇඹුල ගෙනයාම, පීදීගෙන එන ගොයම කුරුල්ලන්ගෙන් ආරක්ෂා කර ගැනීම, ගොයම් කමත වෙත රැගෙන යාම, අස්වැන්න නෙලාගත් පසුව ඒවා වියලා ගබඩාකරගැනීම, අවශ්‍ය ප්‍රමාණයට පරිහරණයට ගැනීම ආදිය කාන්තාව සතු කාර්යයන් වේ (මනුරත්න,2004,p.36). මෙසේ එම කාර්යයන් සඳහා කාන්තාව දායක වුවද සමාජ පිළිගැනීම වන්නේ කාන්තාව ගෘහයට සීමා වූ පුරුෂයාට දෙවැනි තැන හිමි වන තැන්ත්තියක හැටියටය.

නමුත් වර්තමානයේ දී මේ තත්වය එනම් කාන්තාවට හිමි අවාසිදායක තත්වය වෙනසකට බඳුන් කරමින් සාම්ප්‍රදායිකව කාන්තාවට හිමි කාර්යභාරය වූ දරුවන් රැක බලා ගැනීම හා ගෘහයට පමණක් සීමා වීම යන ආකල්පය වෙනසකට ලක් වී නූතන සමාජය තුළ කාන්තාව මුදල් උපයන්නියකගේ තත්වයට පත්ව තිබේ. එසේම අධ්‍යාපනය තුළින් ඇය ලබන දැනුම අවබෝධය හේතුකොටගෙන පවුල පිළ්බඳව මෙන්ම අනෙකුත් කාර්යයන්හිදී තීරණ ගැනීමේ කාර්යයන්හිදී කාන්තාවගේ මැදිහත් වීමක් දැක ගත හැකිය. කාන්තාවන්හට ඇයගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට නිදහස ලැබී ඇත. උදාහරණයක් වශයෙන් ගත් විට පවුල් සැලසුම් කටයුතුවලදී කාන්තාවන්ගේ දායකත්වය ද පුළුල්ව දැකගත හැකිය. චීනය වැනි රටවල එක්දරු ප්‍රතිපත්තිය හඳුන්වා දීම හා දෙවෙනි දරුවකු පිළිසිඳගැනීම තුළ ස්වාමියා අත්තඩංගුවට ගැනීම පවා සිදුවේ. ඉන්දියාවේ ගැහැණු දරුවන් අවාසනාවේ සංකේතය ලෙස සලකයි. මෙවැනි ආකල්ප හේතුවෙන් කාන්තාවන්ට අවාසිදායක තත්වයන් උද්ගතව ඇති බව ද කිව යුතුය. මැදපෙරදිග රටවල කාන්තාවට තම විවාහක සහකරු තෝරා ගැනීමට පවා අයිතියක් නොමැත. මේ අයුරින් කාන්තාවට නිතැතින්ම පුද්ගල අවකාශය හිමිවුවද වර්තමානයවන විට මේ තත්වය වෙනසකට බඳුන් වී ඇති අතර කාන්තාව පුද්ගල අවකාශයෙන් විතැන් වී පොදු අවකාශය වෙත පියවර තබා තිබේ. නමුත් එහිදී ද පීඩනයන්ට ලක්වීම, අවම වරප්‍රසාද, සූරාකෑමට ලක්වීම, අඩු සම්පත්, අවස්ථාවන් අහිමිවීම කාන්තාවක් වීම නිසාම වන කායික, මානසික හා වාචික හිංසනයන්ට මුහුණ දෙන්නේ පුරුෂාධිපත්‍යයෙන් යුත් සමාජයේ පුරුෂයන්ගේ බල ආධිපත්‍යයට යටත් වෙමිනි. නමුත් ඇය එම පොදු අවකාශය තුළ හිමි භූමිකාවන් මෙන්ම සාම්ප්‍රදායිකව පුද්ගල අවකාශය තුළ හිමි සියලුම කටයුතුවල බර කරමත දරා සිටින්නීය.

තවද ක්‍රමානුකූලව යම් යම් සොයාගැනීම් සමග සමාජය දියුණු තත්වයකට පැමිණියද කාන්තාවට හිමි තත්වයෙහි වෙනසක් දැකගත නොහැකි විය. මුල් කාලීනව ගත් විට අධ්‍යාපනය ලැබීමේ අයිතිය පවා කාන්තාවට හිමි නොවීය. නමුත් එය පුරුෂයන්ට හිමි විය. පිරිවෙන් අධ්‍යාපනය පැවතීම ඊට හේතුවක් යැයි සිතිය හැකිය. උදාහරණයක් වශයෙන් ඇෆ්ගනිස්ථානය වැනි කාන්තා හිංසනය බහුල රටක් ගත් විට තලෙයිබාන් නීති රීති යටතේ කාන්තාවන්ට ඉගෙනීමේ අයිතිය තහනම් කොට ඇති අතර ඔවුන් රැකියාවන්ගෙන් නෙරපා හැරීම සිදුවේ. එසේම 2007-2009 දක්වා කාලය තුළ තලෙයිබාන් නීතිය යටතේ කාන්තා පාසල් 150ක් පුළුස්සා දමා ඇති බව අප දන්නා කරුණක් වන අතර මෙය ඊට කදිම නිදසුනකි.

ඒ අනුව උසස් අධ්‍යාපන කටයුතුවලට යොමු වීම මෙන්ම වෙනත් අධ්‍යාපනික කටයුතු වලට යොමු වීම හේතුවෙන් යම් තත්වයක් ඇයට හිමි වී ඇත. උදාහරණයක් වශයෙන් දක්වන්නේනම් වර්තමානයේ විශ්ව විද්‍යාලයක් ගත් විට එහි බහුතරයක් දක්නට ලැබෙන්නේ කාන්තාවන්ය. මේ අයුරින් අධ්‍යාපනයේ ඉහළ තත්වයකට ගමන් කිරීමට කාන්තාවට හැකියාව හිමිවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වෘත්තීමය තත්වයන් සමග සම්බන්ධ වීමේ හැකියාවද ඇයට හිමි විය. විශේෂයෙන්ම ගුරු වෘත්තිය, අධිකරණ, වෛද්‍ය, පරිපාලන ආදී විවිධ උසස් වෘත්තීන්වල නූතන කාන්තාවගේ වැඩි නියෝජනයක් දැකගත හැකිය. එවන් තත්වයක් තුළ කාන්තාවගේ තත්වය හා කාර්යභාර්ය වෙනසකට බඳුන් වී ඇති බවද කිව යුතුය. ඒ අනුව කාන්තාවන් වර්තමානය වන විට ආර්ථික ක්‍රියාවලිය තුළ මෙන්ම සංවර්ධන ක්‍රියාවලියටද දායක වී ඇති බව කිව යුතුය. සාම්ප්‍රදායිකව කළ මට්ටමේ නිෂ්පාදන ශ්‍රමික අංශවල කටයුතුද කාන්තාවට හිමිවිය. එසේම එහිදී වැඩි ආර්ථික වටිනාකමක් හිමිවූයේද පුරුෂයාටයි. ඒ අනුව පැහැදිලි වන්නේ ද කාන්තාවට පහත් ස්ථානයක් හිමි වී ඇති බවයි.මේ ආකාරයට සමාජ වෙනස්වීමත් සමග ස්ත්‍රී පුරුෂභාවය මත කාන්තාවන්ගේ සමාජ තත්ත්වය තත්වයෙහි හා කාර්යභාර්යෙහි ඇති වූ වෙනස මනාව දැකගත හැකිය.

**සමාජ වෙනස්වීම මත කාන්තාවගේ අධ්‍යාපන තත්ත්වයට වී ඇති වෙනස්වීම**

- ගෝලීය වශයෙන් කාන්තාවගේ අධ්‍යාපනය වෙනස්වීම

ශිෂ්ටාචාරික යුගයන් තුල පැවති අධ්‍යාපන තත්වයන් පිළිබඳ අධ්‍යාපන කටයුතු පවතින්නට විය. මෙහිදි එම අර්ථිකය හා ආරක්ෂාව මත පදනම් වූ යුධ කටයුතු මෙහෙයවීම පුරුෂ පර්ශවය සතුවීම හේතුවෙන්

කාන්තාව නිරායාසයෙන් ම අධ්‍යාපයෙන් ඈත් වූ අතර ඒ සඳහා දැඩි යොමුවක් ද සිදු නොවිය. ශිෂ්ඨාචාර යුගය අවසන් වන විට දී අධ්‍යාපන අක්ෂර මාලාවක් මත පදනම්ව යමින් ඉතා දියුණු මට්ටමක් ගෙන තිබූ අතර එයට හොඳම නිදසුන ලෙස ඉන්දීය, තක්ෂිලාව, නාලන්දාව, වැනි දියුණු අධ්‍යාපන මධ්‍යස්ථාන පෙන්වා දිය හැකිය. මෙකී අධ්‍යාපන අයිතිය සෑම විටම හිමි වූයේ පුරුෂයන්ට පමනක් වූ අතර එකල අධ්‍යාපන ක්‍රමයේ සියල්ල මෙහෙය වූ වේද ග්‍රන්ථ හැදෑරීම කාන්තාවන්ට වාරණයක් වී තිබුනි. වේදපාඨ කාන්තාවක් සවන් දෙන්නේ නම් ඇයගේ කනට ලෝදිය දැමීම, වේදපාඨ කාන්තාවක් කටපාඩම් කරන්නේ නම් ඇයගේ දිව කපා දැමීම ආදී අමානුෂීය දඩුවම් ක්‍රම භාවිතා වන්නට වූ අතර ම ඇය අධ්‍යාපනය හැදෑරීමට නුසුදුසු බව දක්වා ඇත්තේ කාන්තාවට ඇත්තේ දෑගුල් නුවණක් හෙවත් කාන්තාවට නුවණ ඇත්තේ ආහාර පිසිනා විට බත් තැම්බුණ ප්‍රමානය සෙවිමට භාවිතා කරණ හැන්දක මිටක් තරම් කුඩා ප්‍රමාණයක් ලෙස දක්වා ඇත. මේ ආකාරයෙන් මෙකල කාන්තාව අධ්‍යාපන සංස්ථාව තුලින් විශාල පසුබෑමකට ලක්ව ඇත.

පුනරුදයට පළමුව සමාජය තුළ අධ්‍යාපනයට නැඹුරුතාවක් කාන්තාවන් තුළින් දැකිය නොහැකි වූ අතර පුනරුදය සමග සෑම ක්ෂේත්‍රයකම දියුණුවක් ඇතිවිය. ඒ අනුව මෙකල පැවති සංකීර්ණ ජීවන තත්වය මත කාන්තාවද රැකියාවක නිරතවීමේ අවස්ථාව හිමි වූ අතර ඒ සඳහා කාන්තාව අධ්‍යපනය ලැබීම අනිවාර්ය සාධකයක් විය. ඒ අනුව

- 1850 දී මධ්‍යම පාන්තින ගැහැණු ළමයි සඳහා මිස් බස්ස්ගේ නෝර්ත් ලන්ඩන් කොලෙජියට් පාසල ආරම්භ කිරීම.
- 1866 දී කේම්බ්‍රිජ්, එඩින්බරෝ සහ ඩර්හැම් විශ්ව විද්‍යාල මගින් ගැහැණු දේශීය පාසල් විභාග විධිමත් ලෙස විවෘත කිරීම.
- 1860 දී ගැහැණු ළමයින් සඳහා උසස් අධ්‍යාපනය හිමිවන ලදී.
- 1870 දශකය වන විට කාන්තාවන් සඳහා පිළිගත් සිවිල් විශ්ව විද්‍යාලවල අවස්ථාව සමපාතීවීම (මනුරත්න, 2004, p.219-225)

ආදී කරුණු අධ්‍යනයේ දී පුනරුදයෙන් පසුව කාන්තාව වෙත අධ්‍යාපන අවස්ථාවන් හිමි වූ බව දැකගත හැකි ලක්ෂණයකි. නූතන යුගයේ කාන්තාව වෙත අධ්‍යාපනය ලැබීමේ අයිතිය මෙන්ම අවස්ථාවන් හිමිවූ අතර ඒ හේතුවෙන් කාන්තාවන්ගේ සාක්ෂරතාව ඉහළ ගොස් පැවතුනි. කාන්තාවන්ගේ අධ්‍යාපනය සුරකීම වෙනුවෙන් වූ ජාත්‍යයන්තර සංවිධාන නිර්මාණයවීම, පුරුෂයන් අභිබවාගිය අධ්‍යාපනයක් කාන්තාවන් සතුවීම, අධ්‍යාපනය සමග සම්බන ධවන ස්ත්‍රී පුරුෂ අනුපාතය සලකාබලන විටදී ස්ත්‍රීන්ගේ සහභාගීත්වය ඉහළ අගයක් ගැනීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හා පර්යේෂකයන් ලෙසින් කාන්තාවන් කටයුතු කිරීම වැනි කරුණ සලකාබලන විට දී නූතන යුගය වන විට පුරුෂයා අභිබවාගිය අධ්‍යාපනයක් කාන්තාව වෙත හිමිවීම හා ඒ වෙනුවෙන් කටයුතු කිරීමක් සිදුවන බව පැහැදිලි වන කරුණකි.

- දේශීය සමාජ වෙනස්වීම මත කාන්තාවගේ අධ්‍යාපනය

ලාංකීය සමාජයේ මුල් අවදිය තුල විධිමත් අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිතව නොතිබූ අතර ප්‍රාථමික ආර්ථික ක්‍රියාවලීන් කේන්ද්‍ර වූ අධ්‍යාපන ක්‍රමයක් හා නොයෙක් ශිල්පයන් මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමයක් පමනක් පැවතුනි. ආර්ථිකය සඳහා කාන්තාවගේ දායකත්වයක් නොලැබීම හේතුවෙන් හා ශිල්ප ක්‍රමයන් හැදෑරීම සඳහා කාන්තාවට අවස්ථාව නොලැබීම හේතුවෙන් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව කාන්තාවන්ට අහිමිව පැවති අතර එය පුරුෂයන් පමනක් කේන්ද්‍රව නිර්මාණය වී පැවතුනි.

මහින්දාගමනයත් සමග කාන්තාවගේ අධ්‍යාපන අයිතිය හිමි වූ අතර පුරුෂයන්ට සේම කාන්තාවට ද අධ්‍යාපනය ලැබීමේ අයිතිය හිමි වන ලදී. ශිල්ප ශාස්ත්‍රය ලබාගැනීම තුලින් ඉදිරියට ගමන් කළ කාන්තාවන් රැසක් මහින්දාගමනයෙන් පසුව බිහි වූ අතර ඒ අනුව පළමුවන උපතිස්ස රජුගේ බිසව වන මැනවින් අභිධර්මය හදාරා තිබීම, පළමු අග්බෝ රජුගේ රාජසභාවෙහි දොළොස් මහ කවියන් අතරින් *දළ බිසෝ කිවිඳිය* වැනි කාන්තාවන් සිටීම, සීගිරි ගීත අතුරින් කාන්තවන් විසින් ලියන ලද කවි හමුවීම හා අනුලා, ලීලා වැනි රාජණියන් ලියවී ඇති වංශකතා තොරතුරු ඇසුරින් කාන්තාවගේ අධ්‍යාපනය අයිතිය ලැබීම හා කාන්තාව අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව හිමි වූ බව පැහැදිලි වනු ඇත.

යටත්විජිත යුගයේ ආරම්භය වර්ෂ 1505 දී සිදු වූ අතර පෘතුග්‍රීසි, ලන්දේසි හා ඉංග්‍රීසි වශයෙන් වූ ආක්‍රමණික කණ්ඩායම් තුනක් යටතේ මෙකී යුගය පාලනය වන ලදී. ඒ අනුව ක්‍රි.පූ. 1505 සිට ක්‍රි.පූ. 1638 දක්වා කාල සීමාව තුල දී මුහුදුබඩ ප්‍රදේශය තුල පැවති පැරිෂ් පාසල් මගින් අධ්‍යාපනය ලබාදීම සිදුකළ අතර ක්‍රි.පූ. 1638 සිට ක්‍රි. පූ. 1802 දක්වා කාල සීමාව තුල පාලනය කළ ලන්දේසි ආක්‍රමණිකයන් ලංකාව තුල විධිමත් අධ්‍යාපන ක්‍රමයක් ඇති කරන ලදී. එසේම ක්‍රි.පූ. 1802 සිට ක්‍රි.පූ. 1931 දක්වා කාල සීමාව තුල පාලනය කළ ඉංග්‍රීසි ජාතිකයන් හෙවත් බ්‍රිතාන්‍ය පාලන කාලසීමාව තුල දී ලංකාවේ අධ්‍යාපනය ප්‍රධාන ස්ථර තුනකින්

ක්‍රියාත්මක වූ අතර වශයෙන් කොටස් ත්‍රිත්වයක් ක්‍රියාත්මක වන ලදී. මෙලෙස ක්‍රියාත්මක වූ අධ්‍යාපන ක්‍රමය තුල අධ්‍යාපනය ලැබීමේ අයිතිය කාන්තාව වෙතට ද හිමි වූ අතර විධිමත් අධ්‍යාපනයක් හිමිවන ලදී. ඒ අනුව මීගමුව නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය පළමු කාන්තා පාසල වශයෙන් ආරම්භ වූ අතර එතෙක් ප්‍රභූ කාන්තාවට පමනක් සීමා වූ අධ්‍යාපන අයිතිය සෑම කාන්තාවක් වෙතම හිමිවීම යටත්විජිත යුගය තුල දී සිදුවන ලදී.

කාලයත් සමග සමාජ වෙනස් වීමත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ස්ථාපිත වීමට පටන් ගැනීමත් සමාජය තුල මුල් බැස ගෙන තිබූ නොයෙකුත් නොගැලපෙන මතවාදයන් බිඳ වැටීමත් සමග ස්ත්‍රී සඳහා වූ අයිතීන් කරලියට පැමිණීම නිසාවෙන් කාන්තාවන් විශාල ලෙස සියලු ම අංශයන් වල ඉදිරියට ගමන් කරන්නට විය.එසේ කාන්තාවක්ගේ අධ්‍යාපනය විවිධ ක්ෂෙත්‍රයන් ඔස්සේ වූ විකාශනයන්ට උදාහරණ පහත පරිදි පෙන්වා දීමට හැකිය. පහතින් දැක්වෙනු ඇත්තේ ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානයට අයත් රටවල් කිහිපයක උපාධිධාරින් කාන්තාවන්ගේ ප්‍රමාණයයි. මෙය දක්වා ඇත්තේ සමස්ථ උපාධිධාරීන් අතරින් ප්‍රතිශතයක් ලෙසයි.

වගුව 1: උසස් අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

| රට | වර්ෂය 2005 | 2015 | 2020 |
|---|---|---|---|
| ඔස්ට්‍රේලියාව | 56 | 62 | 62 |
| චෙච් ජනරජය | 57 | 55 | 61 |
| ඩෙන්මාර්කය | 59 | 66 | 68 |
| ප්‍රංශය | 56 | 65 | 66 |
| ජර්මනිය | 53 | 65 | 61 |
| හංගේරියාව | 64 | 66 | 73 |
| ඉතාලිය | 59 | 68 | 70 |
| ජපානය | 49 | 49 | 54 |
| කොරියාව | 49 | 54 | 56 |
| පෝලන්තය | 66 | 63 | 62 |
| ස්විට්සර්ලන්තය | 43 | 49 | 48 |
| තුර්කිය | 44 | 35 | 37 |
| එක්සත් රාජධානිය | 58 | 72 | 72 |
| එක්සත් ජනපදය | 58 | 61 | 57 |
| ස්වීඩනය | 63 | 74 | 76 |

මූලයː OECD, 2008

වර්තමාන ලෝකයේ හඳුනාගත හැකි නව ප්‍රවණතාවයක් වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පිරිමින්ට සාපේක්ෂව වැඩි කාන්තා නියෝජනයක් දක්නට ලැබීමයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්කල ප්‍රාථමික මෙන්ම ද්විතීක අධ්‍යාපනයේ නියැලෙන කාන්තා ප්‍රතිශතය පිරිමින්ට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් ගනී. එපමණක් නොව උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වන සමස්ත ප්‍රතිශතයෙන් 70% ඉක්මවූ ප්‍රතිශතයක් සිටින්නේ කාන්තාවන්ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් වැඩි වශයෙන් දැකගත හැකිය. සමස්තයක් ලෙස 2005-2020 දක්වා වූ කාලය තුළ ගෝලීය වශයෙන් උපාධිධාරී කාන්තා ප්‍රතිශතය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

වගුව 2: ගෝලීය වශයෙන් උපාධිධාරී කාන්තාවන්ගේ ප්‍රතිශතයන්

| රට | 2005 | 2015 | 2020 |
|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව | 56% | 62% | 62% |
| චෙච් ජනපදය | 57% | 55% | 61% |
| ඩෙන්මාකය | 59% | 55% | 68% |
| ප්‍රංශය | 56% | 66% | 66% |
| ජර්මනිය | 53% | 65% | 61% |
| හංගේරියාව | 64% | 66% | 73% |
| ඉතාලිය | 59% | 68% | 70% |
| ජපානය | 49% | 49% | 54% |
| කොරියාව | 49% | 54% | 56% |
| පෝලන්තය | 66% | 63% | 62% |
| ස්විස්ටර්ලන්තය | 43% | 49% | 48% |
| තුර්කිය | 44% | 35% | 37% |
| එක්සත් රාජධානිය | 58% | 72% | 72% |
| එක්සත් ජනපදය | 58% | 62% | 57% |
| ස්වීඩනය | 63% | 74% | 76% |

මූලය: හේරත්,2013.p.12

එමෙන්ම සාක්ෂරතාවය යනු සංඛ්‍යා කියවීම , ලිවීමට හා භාවිතා කිරීමට තොරතුරු හැසිරවීමට අදහස් හා ප්‍රකාශ කිරීමට තීරණ ගැනීමට සහ ගැටලු විසඳීමට ඇති හැකියාවයි. ලොව සාක්ෂරතා අතින් ඉහළම රටෆින්ලන්තයයි. එසේම ඉහළ සාක්ෂරතාවය ඇති රටවල් ලෙස උතුරු කොරියාව - 100%, යුක්රේනය - 99.80%, පෝලන්තය - 99.80% දැක්විය හැකිය. යුනිසෙෆ් සංවිධානයේ දත්තයන් සලකා බැලීමේ දී ශ්‍රී ලංකාව තුළ අවුරුදු 15 ත් 24 අතර ගැහැණු දරුවන් සාක්ෂරතාව අතින් සැලකූ විට එම වයසේ ම පිරිමි ළමන්ට වඩා වැඩි අගයක් ගන්නා බව මනාව දැක ගත හැකිය.

- වයස 15- 24 අතර කාන්තාවන් (2008 - 2012) සාක්ෂරතාව 98.6%
- වයස 15 - 24 අතර පිරිමින් (2008- 2012) සාක්ෂරතාව 97.7% (Yamini.2019).

මෙලෙස කාන්තාව අධ්‍යාපනය තුළ ස්ථාවර කිරීම ඔවුන්ගේ අභිවෘද්ධිය සලසාලීම පමණක් නොව රටක අනාගතය, මතු පරපුර වෙනුවෙන් කෙරෙන අගනා ආයෝජනයකි. අදවන විට මෑතක් වන තුරුම අධ්‍යාපන හිමිකම අහෝසි කර දමා තිබූ මුස්ලිම්

කාන්තාවන්ට පවා අධ්‍යාපන අයිතිය හිමි වී තිබීම සතුටට කාරණයකි. මේ ආකාරයට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම අඛණ්ඩ අධ්‍යාපනයේ නියැළීම හේතුකොටගෙන සාක්ෂරතා ප්‍රතිශතය ද බොහෝ රටවල 90% ඉක්මවූ ප්‍රමාණයක් දක්නට ලැබේ. මේ ආකාරයේ වූ සාධනීය තත්ත්වයක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් සම්බන්ධයෙන් දැකගත හැකි වේ.

වර්තමානය වන විට දේශීය හා විදේශීය සියලු සීමාවන් අතික්‍රමණය කිරීමට කාන්තාවට හැකි වී ඇත. ඒ අනුව වර්තමානය වන විට පිරිමි හා සාපේක්ෂව ම කාන්තාවන් ද ලෝකය ජය ගෙන ඇත නව නිර්මාණයන් රාශියක් ලෝකයට ඉදිරිපත් කීමට කාන්තාවන්ට ද හැකි වී ඇත. මේ සියල්ලට ම හේතු සාදක වී ඇත්තේ වර්තමාන සමාජයන්වල පවතින සාමානාත්මතාව හා කාන්තවන් කෙරෙහි පැවතී බොහෝ සීමාවන්වලින් මිදී නිදහස් ජීවන රටාවක් හිමි කර ගැනීමට හැකි වීම බලපා ඇත . කාන්තාවන් විසින් නිර්මාණය කරන ලද නව සොයා ගැනීම් කිහිපයක් පහතින් දැක්වෙයි .

- වක්‍ර කියත් - තබිතා බාබිට්
- මින්මැදුර - ජිනී කීලෙප්ප්‍රෙව්
- අයිස්ක්‍රීම් සාදන්නිය - නන්සි ජොන්සන්
- පරිගණක ඇල්ගොරිතම - ඇඩා ලව්ලන්ස්
- දුරේක්ෂය - සාරා මතේ
- පිගන් සෝදන ද්‍රව්‍ය-ජෝසසපින් කොක්රේන් (Williamon,2021).

**සමාජ වෙනස්වීම මත කාන්තාවගේ ආර්ථීක තත්ත්වයට වී ඇති වෙනස්වීම**

• ගෝලීය වශයෙන් වෙනස්විම

අතීත සමාජයේ ආර්ථිකය ශක්තිමත් කිරීමෙහිලා කාන්තා දායකත්වයක් නොවීය. ඊට හේතු වූයේ ඒ සඳහා පවුල් සංස්ථාව තුළින් මෙන්ම සමාජය තුළින් ද ඉඩ අවකාශය ඔවුන්ට හිමි නොවීමයි. ප්‍රථම වරට ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ කාන්තා නියෝජනය සිදුවූයේ දෙවන ලෝක යුද්ධ සංග්‍රාමය තුළය. ලෝක යුධ අවධියේදී යුධ කටයුතු සඳහා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නියැලුණු පිරිමි පාර්ශවයට යොමු වීමට සිදු විය. මෙම පසුබිම තුළ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ රැකියා පුරප්පාඩු නිර්මාණය විය. මෙකී පුරප්පාඩු වූ රැකියා සඳහා කාන්තා පාර්ශවය යොමුකරවා ගැනීමට යුරෝපීය සමාජයේ ව්‍යාපාරිකයන් කටයුතු කරන්නට වූ අතර මෙය ව්‍යාපාරික ලෝකය තුළ කාන්තා නියෝජනයේ ආරම්භක සන්ධිස්ථානය සනිටුහන් කරන්නක් විය.

ශිෂ්ටාචාර යුගයේ අගභාගයේ දී කාන්තා සඳහා ආර්ථික සංස්ථාව තුළ නිර්මාණය වූ සමාජ තත්වය ද පෙර පැවති ආකාරයේ තත්වයක් නොවූ අතර යම් යම් වාරණයන් පැනවෙන ලදී. ඒ අනුව කාන්තාවකට තබාගත හැකි මුදල් ප්‍රමාණය සඳහා සීමා පැනවූ අතර පනම් 50ක මුදලක් පමණක් එලෙස තබාගත හැකි වූ උපරිම මුදල් ප්‍රමාණය විය. එසේම මෙම කාලසීමාව තුල කාන්තාවන් සඳහා වූ රැකියාවන් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී රාජ්‍ය අනුග්‍රහය ද හිමිවූ සුවිශේෂී රැකියාවක් ලෙස ගණිකා වෘත්තිය පෙන්වා දිය හැකි අතර ඒ ආකාරයේ සමාජ තත්වයක් ආර්ථිකය තුල කාන්තාවට හිමිව තිබුනි.

වර්තමාන ලෝක ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය 47.7%කි. 1997 - 2007 අතර කාලය තුළ කාන්තාවන් මිලියන 200ක් අලුතින් ශ්‍රම වෙළඳපොළට එක්වූ අතර මෙම වර්ධනය රැකියා වනිතාකරණය යන සංකල්පය ජීවමාන කිරීමට සමත් වන්නක් විය.වත්මන් ගෝලීය සන්දර්භය සලකා බලන කළ කාන්තාවන් වැඩි වශයෙන් රැකියා සඳහා යොමු වෙති. විශේෂයෙන්ම ඔවුන් ඇගලුම් සහ අනෙකුත් කර්මාන්ත ආශ්‍රිත රැකියා කෙරෙහි යොමු වීමට වැඩි නැඹුරුවක් දක්වති. විශේෂයෙන් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා සමාජ සජීවීකාරකයන් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කාන්තා නියෝජනය වැඩිවිය. එසේම "කාන්තා ශ්‍රම බලකාය සවිබල ගැන්වීම" මැයෙන් 2019දී ඇමරිකානු වාණිජ මණ්ඩලයේ පැවති සාකච්ඡාවේදී දක්වනුයේ දුගී බව අඩු කිරීම හා ආර්ථික වර්ධනය දිරිගැන්වීමේ එක් ග්‍රාමක බලවේගය ලෙසින් සැලකිය හැක්කේ කාන්තාවන් ආර්ථිකය අතින් ශක්තිමත් කිරීම බවයි. කෙසේ නමුත් අදවන විටත් රැකියා ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කොටගත් විභේදනයන් දක්නට ලැබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දෙන්නේ ලෝකයේ වැඩ කොටසින් තුනෙන් දෙකකට වඩා වැඩි කොටසක් කාන්තාවන් විසින් සිදු කරන බවයි. දවසේ පැය 24න් පැය 17කට වඩා කාන්තාවෝ වැඩෙහි නියැලෙයි. නමුත් සමස්ත දේපළ වලින් කාන්තාවන්ට හිමි වන්නේ දහයෙන් එකක් වැනි සුළු ප්‍රමාණයක් බවත් එම සංවිධානය වැඩිදුරටත් පෙන්වා දෙයි. සාමාන්‍යයෙන් ලොව පුරා කාන්තාවන් දිනකට පැය හතරයි මිනිත්තු විසිදෙකක් නොගෙවූ ශ්‍රමයෙහි නියැලෙන බවට තොරතුරු හමුවේ. ඒ අතර ලොව පුරා රටවල් කිහිපයක පරිපාලන ක්ෂේත්‍රයන් පර්යේෂණයට ලක් කළ මර්සර් විසින් විවිධ අංශවල නියැලෙන කාන්තා නියෝජනය ප්‍රතිශතාත්මකව දක්වා ඇත.

- ✓ විධායක ශ්‍රේණිය - 23%
- ✓ ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්
- ✓ කළමණාකරුවන් 29%
- ✓ වෘත්තිකයන් - 42%
- ✓ සහාය කාර්ය මණ්ඩලය - 47%

(catalyst.org, 2021).

● දේශීය වශයෙන් වෙනස්වීම

ලාංකීය සමාජයේ මුල්ම අවස්ථාව වශයෙන් ගෝත්‍රික සමාජ ක්‍රමය පෙන්වා දිය හැකි අතර එකී සමාජයේ ආර්ථිකය ප්‍රාථමික ආර්ථික ක්‍රියාකාරකම් හා දඩයම වැනි ක්‍රමෝපායන් තුල රදාපවතින ලදී. ලෙස නිර්මාණය වූ ආර්ථික සංස්ථාව තුල පුරුෂයා කේන්ද්‍රීයව එකී ක්‍රියාකාරකම් රදාපැවතුනු අතර කාන්තාව එහි නොවැදගත් පුද්ගලයෙකු ලෙස සලකන ලදී. ඒ අනුව ආර්ථිකය සදහා සක්‍රීය දායකත්වයක් කාන්තාව තුලින් නොලැබුන අතර ශිෂ්ඨාචාරගතවීමට පෙර හා ශිෂ්ඨාචාරගත වූ මුල් අවදිය තුල ආර්ථික සංස්ථාව කාන්තාවන්ගෙන් තොරව නිර්මාණය වී පැවතුනි.

යටත්විජිත යුගය තුල දී අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම, වැවිලි බෝග හදුන්වාදීම, අපනයනය මත පදනම් වූ රාජ්‍ය සේවය තුලට ද කාන්තාවගේ දායකත්වය ලැබුන අතර ඒ හේතුවෙන් කාන්තාව ආර්ථික වෙත සක්‍රීය දායකත්වයක් ලබාදෙන ලදී. ශ්‍රමවිශේෂායනයක් යටත්විජිත යුගයේ දී ඇතිවූ අතර මෙකී ශ්‍රමවිශේෂායනය හමුවේ කාන්තාව ආර්ථිකය වෙත සක්‍රීය දායකත්වයක් ලබාදෙන ලදී.යටත්විජිත යුගයේ දී ආර්ථික සංස්ථාව වෙත ලබාදී තිබූ සක්‍රිය දායකත්වය නූතන යුගයේ දී ද කාන්තාව ලබාදෙනු ලබන අතර අද වන විට කාන්තාව සුවිශේෂී දායකත්වයක් ආර්ථිකය වෙත ලබාදෙනු ලබයි.

2011 වසරේ සිට 2017 වසර දක්වා කාන්තාවන්ගේ ශ්‍රම බලකායේ අනුපාතය සලකාබලන විට දී නූතනයේ කාන්තාව ආර්ථිකය වෙත ලබාදෙන දායකත්වය අවබෝධක කරගත හැකි අතර ඒ අනුව,

වගුව 3: නූතනයේ කාන්තාව ආර්ථිකය වෙත ලබාදෙන දායකත්වය 2011-2017 (%)

| වර්ෂය | ස්ත්‍රී ශ්‍රම බලකා අනුපාතය |
|---|---|
| 2011 | 34.3% |
| 2012 | 32.9% |
| 2013 | 35.4% |
| 2014 | 34.6% |
| 2015 | 35.9% |
| 2016 | 35.9% |
| 2017 | 36.6% |

*(මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්ට්මේන්තුව)*

එසේම ලාංකීය විදෙස් සංචිත සම්ප්‍රේෂණය කරනු ලබන ප්‍රධාන මාර්ගයන් වශයෙන් විදෙස් රැකියා හා ඇගලුම් ක්ෂේත්‍රය පෙන්වා දිය හැකිය. මෙකී අංශ ද්විත්වය තුලම වැඩි වශයෙන් කාන්තාවන්ගෙ දායකත්වයක් ලබාදෙනු ලබන අතර 2019 වසරේ දී විදෙස්ගත වූ පුද්ගලයන් අතුරින් 40%ක් හෙවත් 80,998ක් කාන්තාවන් වන අතර 2018 වසරේ දී ආර්ථික වශයෙන් සක්‍රීය කාන්තාවන් ප්‍රමාණය 2,964,224 කි. ඒ අනුව නූතන යුගය තුල්දී කාන්තාව සක්‍රීය ලෙසින් ආර්ථික සංස්ථාවට දායක වන අතර අතීතයේ දී අක්‍රීය දායකත්වයක් ලබාදෙනු ලැබූ කාන්තාව අද වන විට සක්‍රීය දායකත්වයක් ලබාදෙනු ලබයි.

එසේම ශ්‍රි ලංකාවේ කාන්තාවන්ගේ සේවා නියුක්ති මහ බැංකු වාර්තාවේ පහත පරිදි පෙන්වා දී ඇත.

වගු අංක 1.4 ශ්‍රි ලංකාවේ කාන්තාවන්ගේ සේවා නියුක්ත 2009-2011

| | 2009 | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|---|
| | කාන්තාවන් සංඛ්‍යාව | (%) | කාන්තාවන් සංඛ්‍යාව | (%) | කාන්තාවන් සංඛ්‍යාව | (%) |
| වෘත්තිය මධ්‍යම හා ලිපිකරු රැකියා | 1960 | 1.53% | 1964 | 1.50% | 2012 | 1.58% |
| පුහුණු රැකියා | 5380 | 4.21% | 6417 | 4.91% | 6582 | 5.18% |
| අර්ධ පුහුණු රැකිය | 361 | 0.28% | 562 | 0.43% | 440 | 0.35% |
| නුපුහුණු රැකියා | 6366 | 4.98% | 8962 | 6.83% | 10240 | 8.06% |
| ගෘහ සේවය | 113678 | 88.99% | 112752 | 86.30% | 107816 | 84.8% |
| එකතුව | 127745 | 100.00% | 130657 | 100.00% | 127090 | 100.0% |

මූලය: ශ්‍රි ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2012-ශ්‍රි ලංකා මහ බැංකුව

ඒ අනුව ගෝලීය හා දේශීය වශයෙන් වෙන් වෙන්ව අධ්‍යනය කිරීමේ දී දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වනු ලබන්නේ මානව සමාජය ආරම්භක අවස්ථාව තුල දී කාන්තාව ආර්ථිකය වෙත අවම දායකත්වයක් ලබාදී තිබූ බවත් කෙමෙන් සමාජ වෙනස්වීම් හමුවේ සංකීර්ණ වන සමාජය තුල පුරුෂයා හා සමාන වූ දායකත්වක් නූතනය වන විට ලබාදෙන බවයි.

**සමාජ වෙනස්වීම මත කාන්තාවගේ දේශපාලනමය තත්ත්වයට වී ඇති වෙනස්වීම**

- දේශීය කාන්තා දේශපාලන වෙනස්වීම

පැරණි සමාජයේ දේශපාලන අධිකාරීත්වය හිමිවූයේ පුරුෂ පාර්ශවයට පමණි. දේශපාලන පක්ෂ පිහිටුවීම, ඡන්දය දීම, මැතිවරණ සඳහා ඉදිරිපත් වීම මෙන්ම දේශපාලන මතිමතාන්තර දැරීමේ අයිතිය එදා පිරිමින්ට පමණක් හිමි විය. නමුත් පසු කාලීනව දේශපාලන අයිතිය කාන්තාවන්ට ද හිමි විය. වසර 2500කට වැඩි ශ්‍රී ලංකා ඉතිහාසය තුළ රාජ්‍යත්වයට පත් වී ඇත්තේ කාන්තාවයන් සිව් දෙනෙකු පමණි. ඒ අනුලාදේවි, සීවලී, ලීලාවතී හා කල්‍යාණි යන රැජිනියන් වන අතර ඔවුන් බලයේ සිටියේ කෙටි කාල සීමාවක් සඳහා පමණක් වන අතර එයද කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් භුක්ති විදීමක් ලෙස නොව කිසියම් සුවිශේෂී තත්ත්වයක් තුළ හෝ අහම්බෙන් ලැබුණු අවස්ථා ලෙසිනි (පෙරේරා, 2017).

නමුත් ලංකාව තුළ සිදු වූ ඩොනමෝර් ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් වශයෙන් සර්වජන ඡන්ද බලය හරහා ඡන්ද අයිතිය කාන්තාවට ද හිමි විය. නමුත් කාන්තාවන් සඳහා ඡන්ද බලය හිමි වුවත් සැලකිය යුතු දේශපාලන නියේජයක් වර්තමානය වන විටත් කාන්තාවන් සම්බන්ධයෙන් නොපවතී. මෙහිදී විශේෂයෙන් ඡන්ද අයිතිය ලබා ගැනීමේ දී සපුරාලිය යුතු කොන්දේසි අතර ප්‍රධාන ලෙස ම පැවතී කොන්දේසියක් වන්නේ "කාන්තාවක් නොවිය යුතුය" යන්නයි (මඩහපොළ. 2004. පිටු 13).

ශ්‍රී ලාංකික කාන්තාවට දේශපාලනයට සම්බනද වීමට අවස්ථාව ලබා ගැනීමට හැකි වූයේ සර්ව ජන ඡන්ද බලය ලබා ගැනීමත් සමග ය . 1925 දී ප්‍රථම වතාවට කාන්තා දේශපාලන අයිතීන් ලබා ගැනීම සඳහා කටයුතු කරන ලදී . ලංකා ජාතික සංගමයේ වාර්ෂික රැස්වීමක දී මල්ලිකා කුලඟන සමිතිය නියෝජනය කළ ඇසිලින් තෝමස් ලාංකික කාන්තාවට සීමිත ඡන්ද බලයෙන් හෝ පවරන ලෙස ඉල්ලා සිටියාය. 1927 දී ඩොනමෝර් කොමිසම විසින් කාන්තාව වෙනුවෙන් එම කොමිසමට අදහස් ඉදිරිපත් කිරීම සඳහා කාන්තා සංවිධානයක් පිහිටුවා ගන්නා ලෙස යෝජනා කරන ලදී . ජෝර්ජ් ඊ ද සිල්වා, ඊ. ආර්. තම්බිමුත්තු හා සොලමන් ඩයස් බණ්ඩාරනායක යන නායකත්වයෙන් ඊට අනුකූලතාවය දක්වමින් කාන්තා සර්වජන සංගමය පිහිටුවා ගැණිනි. එම සංවිධානය 1927 දී ඩොනමෝර් කොමිසම ඉදිරියේ කරුණු දැක්වූ අතර 1931 දී ශ්‍රී ලාංකික කාන්තාවද පිරිමින් සමඟ සමව සර්වජන ඡන්ද බලය හිමිකර ගත්හ. මුල් කාලයේ අවුරුදු 30 වැඩි කාන්තාවන්ට පමණක් ඡන්ද ලබය ලබා දුන් අතර නමුත් පසු ව කල දැඩි ඉල්ලීම මගින් 1931 දී අවුරුදු 21 වැඩි කාන්තාවන්ට ඡන්ද බලය හිමි වූ පළමු රට ශ්‍රී ලංකාව ලෙස ඉතිහාස ගත විය. (කාන්තා දේශපාලන දැනුම හා සහභාගීත්වය වර්ධනය කිරීම, පුහුණු අත් පොත)පාර්ලිමේන්තුව තුල ස්ත්‍රී නියෝජනය දෙස අවධානය යොමු කිරීමේ දී 1947 ප්‍රථම පාර්ලිමේන්තු ඡන්දය පැවැත්වූ අතර එහිදී ස්ත්‍රී අපේක්ෂිකාවන් තිදෙනෙකු ඉදිරිපත් විය .

- කිරි ඇල්ල ආසනය නියෝජනය කරමින් ඩේසි මරියා ප්ලෝරන්ස් සේනානායක මහත්මියත් (ලංකා සම සමාජ පක්ෂය)
- මැද කොළඹ නියෝජනය අයේෂා රාවුෆ් මහත්මියත් (ස්වාධීන)
- අම්බලන්ගොඩ-බලපිටිය නියෝජනය කරමින් ශ්‍රීමනී අභය ගුණවර්ධන මහත්මියත්

ඒ අතර විය. අයේෂා රාවුෆ් සහ ශ්‍රීමනී අභය ගුණවර්ධන යන අපේක්ෂිකාවන් දෙදෙනා මෙම මැතිවරණයේ දී පරාජයට පත් වූ අතර ප්ලෝරන්ස් සේනානායක මහත්මිය ප්‍රථම පාර්ලිමේන්තුවේ 95 ක් මන්ත්‍රී මණ්ඩලයේ එකම මන්ත්‍රීවරිය ලෙස තේරී පත් වූවාය (මඩහපොළ, 2004. 17).

- ගෝලීය වශයෙන් කාන්තාවගේ දේශපාලන වෙනස්වීම

අන්තර් පාර්ලිමේන්තු සංගමය විසින් රටවල් 189ක් ඇසුරින් කරන ලද අධ්‍යයනයකට අනුව සමස්ත ලෝකයේම ව්‍යවස්ථාදායක යන්හි කාන්තා නියෝජනය 2012 වන විට 19.6%ක් බව පෙන්වා දී ඇත (ලියනගේ, 2012). 2016 ජුනි 01 දින වනවිට ලෝකයේ විවිධ රටවල ව්‍යවස්ථාදායකය තුළ කාන්තා දේශපාලන නියෝජනයන්ගෙන් මුල් රටවල් 12 ගණනයන් පහත පරිදි වේ.

වගුව 5: 2016 ජුනි 01 දින වනවිට ලෝකයේ විවිධ රටවල ව්‍යවස්ථාදායකය තුළ කාන්තා දේශපාලන නියෝජනය

| WORLD CLASSIFICATION | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| Rank | Country | Lower or single House | | | | Upper House or Senate | | | |
| | | Elections | Seats* | Women | % W | Elections | Seats* | Women | % W |
| 1 | Rwanda | 03.09.2018 | 80 | 49 | 61.3% | 26.09.2011 | 26 | 10 | 38.5% |
| 2 | Cuba | 11.03.2018 | 605 | 322 | 53.2% | --- | --- | --- | --- |
| 3 | Bolivia | 12.10.2014 | 130 | 69 | 53.1% | 12.10.2014 | 36 | 17 | 47.2% |
| 4 | Mexico | 01.07.2018 | 500 | 241 | 48.2% | 01.07.2018 | 128 | 63 | 49.2% |
| 5 | Sweden | 09.09.2018 | 349 | 165 | 47.3% | --- | --- | --- | --- |
| 6 | Grenada | 13.03.2018 | 15 | 7 | 46.7% | 27.04.2018 | 13 | 4 | 30.8% |
| 7 | Namibia | 29.11.2014 | 104 | 48 | 46.2% | 08.12.2015 | 42 | 10 | 23.8% |
| 8 | Costa Rica | 04.02.2018 | 57 | 26 | 45.6% | --- | --- | --- | --- |
| 9 | Nicaragua | 06.11.2016 | 92 | 41 | 44.6% | --- | --- | --- | --- |
| 10 | South Africa [1] | 07.05.2014 | 393 | 168 | 42.7% | 21.05.2014 | 54 | 19 | 35.2% |
| 11 | Senegal | 30.07.2017 | 165 | 69 | 41.8% | --- | --- | --- | --- |
| 12 | Finland | 19.04.2015 | 200 | 83 | 41.5% | --- | --- | --- | --- |

මූලයඃ National Parliaments, 2016

වගුව 6: 2019 ජනවාරි 01 දින වනවිට ලෝකයේ විවිධ රටවල ව්‍යවස්ථාදායකය තුළ කාන්තා දේශපාලන නියෝජනයන්ගෙන් මුල් රටවල් 12 ගණනයන්

| WORLD CLASSIFICATION | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| Rank | Country | Lower or single House | | | | Upper House or Senate | | | |
| | | Elections | Seats* | Women | % W | Elections | Seats* | Women | % W |
| 1 | Rwanda | 16.09.2013 | 80 | 51 | 63.8% | 26.09.2011 | 26 | 10 | 38.5% |
| 2 | Bolivia | 12.10.2014 | 130 | 69 | 53.1% | 12.10.2014 | 36 | 17 | 47.2% |
| 3 | Cuba | 03.02.2013 | 612 | 299 | 48.9% | --- | --- | --- | --- |
| 4 | Seychelles | 29.09.2011 | 32 | 14 | 43.8% | --- | --- | --- | --- |
| 5 | Sweden | 14.09.2014 | 349 | 152 | 43.6% | --- | --- | --- | --- |
| 6 | Senegal | 01.07.2012 | 150 | 64 | 42.7% | --- | --- | --- | --- |
| 7 | Mexico | 07.06.2015 | 500 | 212 | 42.4% | 01.07.2012 | 128 | 43 | 33.6% |
| " | South Africa [1] | 07.05.2014 | 399 | 169 | 42.4% | 21.05.2014 | 54 | 19 | 35.2% |
| 9 | Ecuador | 17.02.2013 | 137 | 57 | 41.6% | --- | --- | --- | --- |
| 10 | Finland | 19.04.2015 | 200 | 83 | 41.5% | --- | --- | --- | --- |
| 11 | Iceland | 27.04.2013 | 63 | 26 | 41.3% | --- | --- | --- | --- |
| " | Namibia | 29.11.2014 | 104 | 43 | 41.3% | 08.12.2015 | 42 | 10 | 23.8% |

මූලයඃ National Parliaments, 2016

මේ තුළින් පැහැදිලි වන්නේ ලෝකයේ වැඩිම කාන්තා දේශපාලන නියෝජනයක් පවතින්නේ ඉතාම දිළිඳු රාජ්‍යක් ලෙස සැලෙකෙන රුවන්ඩාවේ බවයි. එසේම දකුණු ආසියාතික කලාපයේ සාක්ෂරතාවය බෙහෙවින්ම අඩු නේපාලය, පකිස්ථානය, බංග්ලාදේශය, ඉන්දියාව වැනි රටවල්ද ලංකාවට වඩා වැඩි කාන්තා දේශපාලන නියෝජනයක් පවතී.

එමෙන්ම 2021 වසරේදී රටවල් 22ක කාන්තා දේශපාලන නායකත්වය දැකිය හැකිය. මීට අමතරව චිලී රාජ්‍යය, ලයිබීරියාව, ආජන්ටිනාව, බ්‍රසීලය, ජර්මනිය, ලිතුබේනියාව වැනි රාජ්‍යන්වල රාජ්‍ය පාලන කාර්යන් වලදී කාන්තාවන් කටයුතු කර ඇත. එසේම බ්‍රිතාන්‍යයේ රාජ්‍ය නායකයා වශයෙන් පාරම්පරිකව රැජිනක් නායකත්වය දරයි. එසේම පසුගිය මැතිවරණ සමයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ පළමු උප ජනාධිපතිනිය වශයෙන් කමලා හැරිස් මහත්මිය පත්විය.(කාන්තා දේශපාලන දැනුම හා සහභාගීත්වය වර්ධනය කිරීම, පුහුණු අත් පොත). මෙලෙස දේශපාලන මතිමතාන්තර දැරීමට පවා අයිතිය අහිමි වූ කාන්තා ප්‍රජාවට මෙයාකාර වූ ඉහළ දේශපාලන නියෝජනයක් හිමිවීම දේශපාලනය තුළ කාන්තා නියෝජනයේ සිදුවූ වෙනස්වීමක් ලෙස හඳුනා ගත හැකිය.

මේ ආකාරයට බලන කළ සමාජ වෙනස්වීම සමගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යටතේ කාන්තාව අතීත සරල සමාජයට වඩා වර්තමානය වන විට ඔවුන්ගේ භූමිකාවන් ආදියද අධ්‍යාපනික, ආර්ථික ,දේශපාලන ආදී වශයෙන් බොහෝ වෙනස්කම්වලට ලක්වී ඇත්තේ මෙම කාන්තාවන් සඳහා වන අයිතීන් හා අයිතිවාසිකම් ආදීයේ පවතිනු ලබන ප්‍රගතියත් සමඟ ඔවුන්ට ඇති සියලු වරප්‍රසාද ලබා ගැනීමට හැකි

විමත් සමඟය . ඒ සමගින් මෙලෙස අතීත කාන්තාවට වඩා වර්තමාන කාන්තාව සියල්ලන්ගෙන් පරිපූර්ණ වූ බවක් දැක ගත හැකිය .

**ආශ්‍රිත ග්‍රන්ථ**


අමරසේකර.ඩී.2004. ස්ත්‍රි පුරුෂ සමාජභාවට හා පවුල.ආරිය ප්‍රකාශකයෝ

ඇන්ටගනී. (2013). කාන්තාවන්ට එරෙහිව ඇති දූර්මත හා ලේබල් අහෝසි කරමු . Samabima.com. https://www.samabima.com/?p=8871

ජන සංඛ්‍යා හා සංඛ්‍යා ලේඛන දෙපාර්තුමේන්තුව.(2017)

මඩහපොළ .ටී. 2004 . ශ්‍රි ලංකාවේ දේශපාලන ආයතන තුළ ස්ත්‍රි නියෝජනය . සූරිය ප්‍රකාශකයෝ

පෙරේරා , ආර් .(2017) කාන්තාව හා දේශපාලන සහභාගිත්වය .Governance,155.

බණ්ඩාර.එස්.අයි .(2019). සොදුරු ලොවට සහය දෙන්න ඉඩ ඉල්ලන කාන්තාව. News.lk ' https://sinhala.news.lk/fetures/item/32672-2019-03-07-22-36-55

ලියනගේ.කේ . 2011. ශ්‍රි ලාංකික ස්ත්‍රින්ගේ දේශපාලන නියෝජනය.පේරාදෙණිය . සාමය සහ යහපාලනය සඳහා වූ කාන්තාවෝ

ලියනගේ. කේ. ) වලාකුළුගේ. එස්. :2006). ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය. අංක 4, ඇඩ්මිස්

ශ්‍රි ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන (2012).http://WWW.cbsl.lk

හේරත්.වී.(2013). කාන්තා සංවර්ධනය රාජගිරිය, ශ්‍රි ජයවර්නපුර මාවත , අංක 58 : ශ්‍රි ලංකා මහ බැංකුව

Catalyst.org.(2021,february 11).Retrieved july 08,2022,form women in the Workforce:

Inter-parliamentary Union.(2019). https://www.google.com/url?sa=t&source=web&rct=j&url=http://archive.ipu.org/wmn-e/arc/classif010119.htm&ved=2ahUKEwi9taPyttz6AhVGFbcAHehbBscQFnoECCsQAQ&usg=AOvVaw3QNs9wZLDvdhngJ1nDvMwh

Mondal.P.(2019)Social Change;Characteristics and Factors. https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.yourarticlelibrary.com/society

Perera.Y,(2019),අධ්‍යාපනය හා ගැහැණු දරුවා .Vibrant Voice. https://www.ivoice.lk/genderequitable-education-for-all

Williamson.Pamela.(2021)10 Incredible Inventions by Woman that Changed thw world.

Inter-parliamentary Union.(2016). https://www.google.com/url?sa=t&source=web&rct=j&url=http://archive.ipu.org/wmn-e/arc/classif010119.htm&ved=2ahUKEwi9taPyttz6AhVGFbcAHehbBscQFnoECCsQAQ&usg=AOvVa